## ඒකක පරීක්ෂණය 2020 - අප්‍රේල් - භූගෝල විද්‍යාව - අංක 06

## පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - මහනුවර - කාලය පැය 01

### ලෝකයේ කර්මාන්ත ස්ථාන ගතවීම

** වඩාත් නිවැරදි පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න.

01). නිෂ්පාදන කර්මාන්ත වල භාවිතා වන ඛණිජ අමු ද්‍රව්‍ය වලට නිදසුනක් වන්නේ,

1.උක් 2. යපස් 3.දැව 4. කඩදාසි 5. විදුරු

02). මානව ප්‍රග්ධනයට අයත් නොවන්නේ,

1 .පුද්ගල හැකියා 2. දක්ෂතා 3.නිර්මාණශීලි ද්‍රව්‍ය 4.මෙවලම් 5. නිපුණතා

03). එක්සත් ජනපදයේ ලිවර්පුල් හා ඇමරිකා එක්සත් ජනපදයේ පිට්ස්බර්ග් යන පදේශ ප්‍රසිද්ධ වන්නේ,

1.යපස් 2. ගල් අඟුරු 3. මිනිරන් 4. රත්තරන් 5. ඛනිජ තෙල්

04).නිපුණතාවයකින් හෙබි විද්‍යාඥයින් ,පර්යේෂකයින්,කළමණාකරුවන් යන අය වැදගත් වන්නේ කිනම් කර්මාන්ත ස්ථාන ගත කිරීමට ද? .

1.යන්ත්‍ර සූත්‍ර නිෂ්පාදනයට 2.කෘෂිකාර්මික නිෂ්පාදනයට 3.අධි තාක්ෂණික කර්මාන්තයට 4. ප්ලාස්ටික් ද්‍රව්‍ය නිෂ්පාදන කර්මාන්තයට 5. යකඩ හා වානේ නිෂ්පාදන කර්මාන්තයට

05). 2014 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ඇඟළුම් කර්මාන්තයේ ආර්ථික දායකත්වය ,

1.19.8% 2. 19.7% 3. .19.6% 4. .19.5% 5. .19.3%

06). ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික හස්ත කර්මාන්තය යටතේ නිපදවන නිෂ්පාදනයක් නොවන්නේ,

1.පිත්තල 2. වෙස් මුහුණු 3. පැදුරු 4. .රස කැවිලි 5. යකඩ හා වානේ

07). ධනය ඇති පුද්ගලයින් හා සමාගම් එකතු වි අතීතයේ සිටම කර්මාන්ත ආරම්භකර ඇත. ඔවුන් හඳුන්වන්නේ.

1.පර්යේෂකයින් 2.විද්වතුන් 3. ව්‍යවසායකයින් 4.ධනවතුන් 5. කර්මාන්තකරුවන්

08). පාරිභෝගිකයා හා නිෂ්පාදකයා සම්බන්ධ වන්නේ කුමණ සාධකය මගින්ද?,

1.භාණ්ඩ 2. වෙළඳපොල 3. නගරය 4. කර්මාන්තය 5. ප්‍රවාහනය

09) .කර්මාන්ත ස්ථානගත විමේ සාධකවල බලපෑම වෙනස් කර ඇත්තේ කිනම් ක්‍රියාවලිය තුළින් ද? ,

1.නාගරිකරණය 2. කාර්මිකරණය 3.සන්නිවේදනය 4.ගෝලියකරණය 5.යටිතල පහසුකම් දියුණු විම.

10).ගුවන් ,නාවික,ගොඩබිම,සහ ප්‍රවාහන පහසුකම් වැඩි ස්ථානවල කර්මාන්ත ස්ථානගත වී නොමැති ප්‍රදේශයක් නොවන්නේ ,

1.ටෝකියෝ 2. චිකාගෝ 3. පිට්ස්බර්ග් 4. ඔහියෝ 5. නිව්සවුත්වේල්ස්

## ii - කොටස

01) i . නිෂ්පාදන කර්මාන්ත යනු කුමක් ද? ල.02

ii. කර්මාන්ත ස්ථානගත විමට බලපාන සාධක පිළිවලින් ලියා දක්වන්න. ල.06

iii. ඔබ නම් කළ සාධක තුනක් නිෂ්පාදන කර්මාන්තය පිහිටුවිමට බලපාන ආකාරය නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. ල.06

iv. කර්මාන්ත ස්ථාන ගතවීමේ මෑතකාලීන ප්‍රවණතා 4 ක් විස්තර කරන්න. ල.06

**02)** i .ශ්‍රී ලංකාව තුළ දැකි හැකි ප්‍රධාන නිශ්පාදන කර්මාන්ත 4 ක් ලියන්න. **ල.02**

ii.ඉන් .ශ්‍රී ලංකා ආර්ථිකයට වැඩිපුර දායක වන කර්මාන්ත පිළිබඳව පහත මාතෘකා යටතේ සාකච්ඡා කරන්න. **(දළ දේශිය නිශ්පාදනය ,සේවා නියුක්තිය, විදේශ විනිමය ඉපයීම )** **ල.06**

iii. සම්පත් උපයෝජනයේ දි සිදුවන පාරිසරික බලපෑම් 3 ක් විස්තර කරන්න. ල.06

iv. කර්මාන්තයක් ස්ථාන ගත කිරිමේ දි අනුගමනය කළයුතු පාරිසරහිතකාමී පාරිසරික ආකල්ප 3 ක් විස්තර කරන්න. ල.06

03) i .ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයේ භෞතික පදනමේ හා මානව පදනමේ අවශ්‍යතා 2 ක බැගින් නම් කරන්න. ල .02

ii. ශ්‍රී ලංකාවේ සංචාරක මණ්ඩලය මගින් ස්ථාපිත කර ඇති ප්‍රධාන සංචාරක කලාප 4 ක් ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න. ල.04

iii.ශ්‍රී ලංකාවට සංචාරකයන් පැමිණිමේ විවිධ අරමුණු ඇත. ඉන් අරමුණු 3 ක් විස්තර කරන්න. ල.06

iv.ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය නිසා සාමාජීය වශයෙන් හා සංස්කෘතික වශයෙන් ඇති විය හැකි යහපත් හා අයහපත් බලපෑම් 3 න බැගින් ලියා කෙටියෙන් විස්තර කරන්න. ල.06